# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/02 - 2023 නොවැම්බර් මස 27 වැනි සඳුදා - 2023.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**බැංකු (විශේෂ විධිවිධාන) පනත**

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 44(9) සහ 44(10) වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගන්නා ලද නිර්ණයන්

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ.

**2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගන්නා ලද නිර්ණයන්**

1. **හැඳින්වීම**

1.1 මෙම නිර්ණයන්, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ සිදුකරන ලද 2023 අංක 01 දරන නිර්ණයන් ලෙස හැඳින්විය යුතු ය.

2. **යෝජනා ක්‍රමයේ පරිපාලනය සහ කළමනාකරණය**

2.1 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ එදිනෙදා කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කටයුතු සම්බන්ධ බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරා ඇත.


1A - G 40847 — 26 (2023/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**3. උපරිම වන්දි මුදල**

3.1 යම් සාමාජික ආයතනයක බලපත්‍රය අවලංගු කළ දිනය වනවිට උපයන ලද පොළිය ද ඇතුළු ව සෑම තැන්පත්කරුවෙකු ම වෙත ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය, ඕනෑ ම මුදල් වර්ගයකින් නම් කර ඇති, ඒකාබද්ධ තැන්පතු වගකීම් සැලකීමෙන් "එක් තැන්පත්කරුවෙකු සඳහා" යන පදනම මත ගෙවිය යුතු ලෙස ගණනය කෙරේ. වන්දි මුදල් ගණනය කිරීමේ දී, බලපත්‍රය අවලංගු කළ දිනට පසු කාලය සඳහා පොළී ගෙවීමක් සිදුකරනු නොලැබේ.

(අ) ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සහ විදේශ මුදල් තැන්පතු යන තැන්පතු දෙවර්ගය ම සම්බන්ධයෙන්, එක් තැන්පත්කරුවෙකුට ගෙවිය යුතු වන්දි මුදල, ඉහත 3.1 ලෙස ගණනය කරනු ලැබූ මුළු රක්ෂණය කරන ලද තැන්පතු ප්‍රමාණයට සීමා විය යුතු අතර එම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) උපරිමයකට යටත් විය යුතු ය.

(ආ) විදේශ මුදල් තැන්පතු සම්බන්ධයෙන් වන විට වන්දි මුදල, රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත් විය යුතු ය.

**4. තැන්පත්කරුවන් විසින් හිමිකම් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය**

4.1 2021.08.06 දිනට පෙර බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටවනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පත්කරුවන් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) උපරිමයකට යටත් ව වන්දි මුදල් ලබාගැනීමට සුදුසුකම් ලබන අතර වන්දි ලබා ගැනීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමක්, එවැනි සාමාජික ආයතනයකට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටවනු ලැබූ දින සිට වසර හතරක් අවසන් වීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

4.2 2021.08.06 දින හෝ ඊට පසු බලපත්‍ර අවලංගු කළ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පත්කරුවන් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) උපරිමයකට යටත් ව වන්දි මුදල් ලබාගැනීමට සුදුසුකම් ලබන අතර වන්දි ලබා ගැනීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමක්, එවැනි සාමාජික ආයතනයකට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කළ දින සිට වසර හයක් අවසන් වීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

**5. රෙගුලාසි අවලංගු කිරීම**

5.1 2021 අගෝස්තු 06 දින අංක 2239/52 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ 2021 අංක 02 දරන රෙගුලාසි, අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක වන දිනයේ සිට අවලංගු වනු ඇත.

**6. බලාත්මක වන දිනය**

6.1 2023 නොවැම්බර් මස 15 දින සිට මෙම නිර්ණයන් බලාත්මක වනු ඇත.

EOG 11 - 0294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.